# නර්තනය ජනතාව අතරට
# පද්මිනි දහනායක ආරියදාස



කොළඹ රාජකීය විද්‍යාලයේ 1959 නොවැම්බර් 25 වෙනිදා Dance of India නම් නෘත්‍ය ප්‍රසංගය නැරඹීමට එවකට අගමැතිව සිටි ආචාර්ය ඩබ්ලිව් දහනායක මහතාටද ආරාධනා ලැබුණි. අතුරු සිදුරු නැතිව පිරීගිය මෙම ශාලාවේ ප්‍රේක්ෂකයන් දල්වාගත් මුවෙන් යුතුව එකම ඉරියව්වෙන් වේදිකාව මත අත් අහසට ලෙලවමින් නොනවත්වාම නර්තන දස්කම් පෑ ඇය දෙස බලා සිටින්නට ඇත. නොනවත්වාම අත්පොලසන් දෙන්නට ඇත. දනන් තුඩග තුඩග ඇගේ නර්තන කෞශල්‍යය ගැන මහත් සේ පැසසුමෙන් කථා කරන්නට ඇත. ඇය වෙන කවුරුවත් නොව අද ද අපේ ආදරයට ප්‍රශංසාවට හා ආදර ගෞරවයට පාත්‍රවූ කළාභූෂණධාරී උඩරට පහතරට සබරගමු යන නෘත්‍යයන්හි හසල දැනුම් සම්භාරයකට උරුමකම් ඇති පද්මිණී දහනායක ආරියදාස ශිල්පිණියයි.

ඇය පොඩි අවධියේ සිටම නැටුමට දැක්වූ දක්ෂතාවය උනන්දුව හා ආශාව අද දවසේ මුළු සිරිලකම පිළිගත් නැටුම් ගුරුවරියක වීමේ පෙර නිමිත්තක් වන්නට ඇත. පොඩි සන්දියේදි ඇයට තිබූ දඟකාර හා විශයකාර නැටුමට ඇති ආශාව දැනගත් පවුලේ සැම ඇය නිසි අධ්‍යාපනය සඳහා ගුරුවරයෙක් සෙවීය. එකළ මෙකළ මෙන් නෘත්‍ය ශිල්පය සඳහා ගුරුවරුන් හිඟකමක් පැවති අතර සමකාලීන පණිභාරත ප්‍රේමකුමාර එපිටරුවල සේෂාපලිහක්කාර ශිල්පීන් සිටියද ඒ අතරින් චිත්‍රසේන වජිරා හා පුරා කියා නැටීමට අත්පොත් තැබීය. ඇගේ ජීවිතයේ නව සංධිස්ථානයක් ඇති කරමින් නර්තන ක්ෂේත්‍රයෙහි නිම්වලලු පුළුල් කරමින් රාම්ගෝපාල් නම් ඉංදියානු නෘත්‍යවරයා පැමිණීම වැදගත් වේ. ඔහුගේ පැමිණීමෙන් ඇගේ නර්තන ජීවිතය තවතවත් ආලෝකමත් වූ අතර 1954 ජූලි 12 වෙන දිනදී දක්ෂිණ භාරතයේ අරුණ්ඩේල්හි කලක්ෂේත්‍ර සෞන්දර්ය අධ්‍යාපන ආයතනයට ඈ ඇතුලත්වීම විශේෂයෙන්ම ඇගේ නර්තන ජීවිතයේ වැදගත් යුගයකට අවතීර්න වීමක් විය. එම අධ්‍යාපන ආයතනයට ඇතුලත්වූ මෙම නර්තන ශිල්පිනියට වසර 5 ක්ම ශාස්ත්‍රීය භාරතීය නාට්‍ය ශිල්පය හැදෑරීමේ භාග්‍ය හිමි විය. ප්‍රථමයෙන්ම ඉංදියාවේ මෙවන් ආයතනයකින් උසස් දස්කම් පා ඩිප්ලෝමා හිමිකරගත් කාන්තාව වීමේ වරප්‍රසාදයද පද්මිණී දහනායක නම් වූ නෘත්‍ය ශිල්පිණියට හිමිවීම ශ්‍රී ලංකාවම ලද ප්‍රසාදයක් වැනිය.

එම උසස් අධ්‍යාපනයෙන් පසු ව භාරතයෙන් පැමිණි වහාම ඈ විශේෂිත නාට්‍ය සංදර්ශන රාශියක් රටපුරා පැවැත්වීමට කටයුතු සංවිධානය කළාය. නවමු අත්දැකීමක් ලබා ගැනීමට මෙයින් ශ්‍රී ලාංකික නෘත්‍ය ශිල්පීන්ට පමණක් නොව කළා රසිකයන්ටද හැකිවීම විශේෂයකි. වරක් ඇය අධ්‍යාපනය කරන අතර වාරයේදී කෙටි නිවාඩුවක් සඳහා ඉංදියාවේ සිට ලංකාවට පැමිණි වාරයකදී පියාගේ අනුග්‍රහයද ඇතිව සිනමා පටයක සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටීමට සිදුවීම ඇගේ ජීවිතයේ නව කඩඉමක් වැන්නග , සැඩ සුලං , චිත්‍ර පටයේ නැටුම් සංදර්ශනයක් සඳහා ඇය තෝරාගත් බව තම පියා මුලින්ම ඇයට කියන විටද ඇගේ හිතේ මොනතරම් ප්‍රාර්ථනා දැල්වෙන්නට ඇතිද? ඉන්පසුව දයා අබේසේකරයන්ගේ ආරාධනයෙන් , ජීවනමේ ගමන සංසාරේ , චිත්‍රපටයේ ද නැටුම් ජවනිකා ඉදිරිපත් කිරීමට ඇයට හැකි විය. එකළ ජනප්‍රියත්වයට පත්වූ චිත්‍රපටි රාශියක නැටුම් සංදර්ශන සඳහා ඇගේ සහය අධ්‍යක්ෂකවරුන්ට නැතිවම බැරිවිය. ඒ

### මහින්ද දිසානායක දිවුල්ගනේ

අනුව ජනප්‍රිය චිත්‍රපටි වූ ' දරුවා කාගෙද ' 'ධීවරයෝ ' ' අල්ලපු ගෙදර' ' යටගිය දවස ' ' අමතක උනාද' ' සුභ සරණ' යන චිත්‍රපටි රාශියක තම රංගනයන් ඉදිරිපත් කිරීමේ භාග්‍යය හා වරප්‍රසාදය ඇයට හිමිවිය. එයින් නොනැවතුන ඇගේ මේ චිත්‍රපට නර්තනය එකළ ජනප්‍රිය වූ නිළියන් වූ සන්ධ්‍යා කුමාරි ජීවරාණී කුලකුලසූරිය ක්ලැරිස්ද සිල්වා සබීතා පෙරේරා ගේ ගුරුවරිය වීමේ දුලභ අවස්ථාව ඇයට ලඟා විය. එපමණක්ද නොව අජාසත්ත රාජ සභා යන නාට්‍යයන්හි නැටුම් ගුරුවරිය වීමද විශේෂයකි.

පුරා අවුරුදු 25ක් රජයේ නැටුම් ගුරුවරියක ලෙස සේවය කිරීමට හැකිවීම ඇය අද පවා සලකන්නේ භක්තියකින් හා ගෞරව පූර්වක හැඟීමකිනි. වර්ෂ 1982 දී ඇය ශ්‍රී පද්ම රංග නාට්‍ය ආයතනය පිහිටුවීමත් එහි වසර 13 ක් පමණ දීර්ඝ කාළයක් සේවය කිරීම ප්‍රසංසනය වූ කාර්යයකිග එහි අධ්‍යාපනය හැදෑරූ සිසුන් 80 දෙනෙක් පමණ 'අරංගේත්‍රම්' සංදර්ශන පවත්වා තිබෙන අතර එහි නාට්‍යකරණය ඉගෙනගත් පිරිස ලංකාවේ විවිධ ප්‍රදේශ වල ව්‍යාප්ත වී ඇගේ නර්තන කළාව ජනතාව අතරට ගෙනයෑමට ඉමහත් අත්වැලක් විය. ඇය අද පවා ඒ ගැන සිහිපත් කරන්නේ දැඩි භක්තියකින් හා ගෞරවයකිනි.

එපමණක් නොව කැළණිය විශ්ව විද්‍යාලයේ සෞන්දර්ය අධ්‍යාපන අංශයේ බාහිර කථිකාචාර්ය වරියක ලෙස කටයුතු කර තිබීමද මෙහිදී වැදගත්වේ. එපමණක් නොව නුවර හා මහරගම බෙල්වුඩ් තරුණ සේවා අංශයේ නර්තන ගුරුවරියක් ලෙස වසර 6 ක් පමණ දීර්ඝ කාළයක් සේවය කරන්නට හැකිවීම ඇගේ කළා දිවියේ නිම්වලලු පුළුල් කරන්නක්ම විය. තවමත් නර්තන ජීවිතයෙන් සමුනොගත් ඇය දැනට සරසවිපාය නර්තන ආයතනයේ ශාස්ත්‍රීය භාරත නාට්‍ය ආචාර්ය වරියක් ලෙස කටයුතු කිරීම කාගෙත් ප්‍රශංසාවට භාජනය වන්නකි. ඒ වන විටත් ඇය වසර 18 ක්ම එහි සේවය කර තිබේ. ඇයගේ උසස් පරමාර්ථයද වන්නේ අපේ සිංහලකම රැකගෙන උඩරට පහතරට සබරගමු යන නැටුම් විශේෂයනට ප්‍රමුඛස්ථානය දී අපේකම හා අපේම සංස්කෘතිය පෝෂණයට යම් පිටුවහලක් සැලසීමය.

පසුගියදා විවේක සුව ලබාගනිමින් තම පුත් චරිත්දිය ආරියදාස පදිංචි වී සිටින මෙල්බන් නගරයට පැමිණි ඇය මාස 2 පමණ කාළයක් රැදී සිටියද ඇයට නම් කිසිම විවේකයක් නොලද තරම්ය. මෙල්බන් රසික ජනතාව ඇය පිළිගැනීම පමණක් නොව ඇගෙන් උගත යුතු දේ මෙල්බන් රසිකයන් උනන්දු වීමද ඉතාම වැදගත් වේග ඇගේ අරමුණද ලාංකික ජනතාව වෙනුවෙන් යම් මෙහෙවරක් කළ හැකිනම් ඇය වෙහෙසවී ලබාගත් එම දායාදය තම රසික දන වෙත නිර්ලෝභීව ප්‍රදානය කිරීමයි. ඈ ඒ සඳහා තම හිමියා වන ආරියදාස මහතා හා දුවණියන් වන රංගනා නවෝදිනී හා රික්ත දියණියන් ගේ සහයෝගයද ඇගේ දිගු ගමනට අත්වැලක් වූවා පමණක් නොව කළා දිවිය ඔපවත් කිරීමටද මහත් උපකාරියක් ම විය. ඇයට තවත් කාළයක් තම සහෘද ලාංකීය ජනතාවට සේවයක් සලසන්නට වාසනාව හා ශක්තිය ලැබේවායි අපි ආශිර්වාද කරමු.


ඔබේ ශ්‍රී ලාංකික දන්ත වෛද්‍යවරයා

Dr Shahnaaz Ozeer
B.D.S. , Dip. Clin. Dent (Restorative) NZ
Dip. Clin. Dent (Oral Medicine) NZ

DENTIST

Facilities are also available for :
Mini implants
Whitening of teeth
Aesthetic dentistry
Preventive Care

1254 Plenty Road, Bundoora 3083
Tel : 03 9467 7760

Sannasa



ඔබේ සියලුම රූපලාවණ්‍ය සහ
කොණ්ඩා මෝස්තර අවශ්‍යතා සඳහා
පහසු මිලට විශ්වාසවන්ත සේවාවක්



Studio Odel

ශ්‍රී ලංකාවේ සහ ඔස්ට්‍රේලියාවේ පූර්ණ සුදුසුකම් වසර 10කට වැඩි පළපුරුද්ද
Certi II, III, IV & Diploma -
Victoria University, Australia

උඩරට පහතරට හා බටහිර ක්‍රමයට මනාලියන් හැඩ ගැන්වීම
කොණ්ඩා කැපීම - කාන්තා පිරිමි හා ළමා
බ්ලෝවේවින් ස්ට්‍රේට්නින්
රී බොන්ඩිං පර්මින් කලරින්
ටින්ටි පොයිල් බ්ලීචින්
ඔයිල් මසාජ් සහ කොණ්ඩා සඳහා විශේෂ ප්‍රතිකාර
උත්සව සඳහා හෙයා අප් සහ හැඩ ගැන්වීම්
සියලුම අවස්ථා සඳහා මේක් අප්
මංගල ආභරණ සැපයීම

ස්ටුඩියෝ ඔඩෙල්

විමසන්න
ශිරානි
9439 0543, 0432 936 922
36 Parry Road Eltham North

Home visits can be arranged